# මගේ කවියෙන් මා නොසොයන්

අඳුරු අහස් ගැබ කෙළවර
රන්වන් පෑයෙන් පායන
පහන් තරුව දැක ගන්නට
ඒ බව දැන හෝ නොම දැන
ඔබත් මමත් අපි හැම දෙන
යමින් සිටිමු එකම අතට
ඒ ගමනේ මට හමු වන
ගල් පරුවත හෙල් ප්‍රපාත
මට වාගෙම ඔබ සැමටත්
යම් දවසක හමු වනු ඇත

මා යන මග කටු පඳුරින්
දෙපය බිඳී ගලන ලෙයින්
කටු මග හැර නිසි මග දැන
ඔබේ ගමන නිම කොට ඔබ
අප සොයනා පහන් තරුව
මට පළමුව දැක ගත හොත්
ඒ වෙනුවෙන් ඔබේ පයට
ආසිරි මල් පිබිදෙනු ඇත

ඒ මල් තුළ මා දකින්න..



මහගම
සේකර

සෙත් සිරි දෙන මහා ගුණ — මුණිඳානන්
සත් හට වන බව දුකට — වෙදාණන්
තිත් ගණඳුරු දුර ලන — දිනිඳාණන්
සිත් සතොසින් නමදිම් — මුණිඳානන්

# විරාමයක්

නෙළුමට හාදුවක් දී උණුසුමේ
සුළඟ රහසින් අසයි ඔබ කොහේ
නෙතු පියන් වසා ගත් කල සීතලේ
දනිමි ඔබ ඉන්නා බව හද ගැබේ

දවයි පාළුව වේදනා මේ හිස් බිමේ
කියා ගන්නට බැරිව තැවෙයි හැම දිනේ
පියාඹන්නට අත්තටු මගෙ දිග නැතේ
මතක මන්දිර ඔබෙ සිනා හඬ වේදනාවයි ජීවිතේ

නින්ද නොයනා රෑ මැදියමේ
ඇඳෙයි ඔබෙ රුව තෙළි තුඩින්
සිහිනයකි මට ආදරෙයි කියූ ඔබ
වස්සාන සිහිනය අවුළුවා දවා ඇත

පැතුමන් සුන් නොකළ හදවතේ
නියඟයක් නොවූ මල් මාවතේ
බලාපොරොත්තුව පහන් දැල්වූ අභියසේ
ඔබෙ සෙනෙහසට තාමත් හිත ඉඩ ඇතේ

සත්සමුදුරින් වෙන්වී ඇති දෙසිතක් අතරේ
සවනත වැකෙන්නේ ඔබ ගැයූ විහඟ ගීය
අනන්තයට යන මාවත කෙළවර
පැතු පැතුම් ළයෙහි හොවා ගෙන
මිහිඳුම් සිහිනේ ඔබ රඳවා ගෙන
පහන් ටැඹ දකින තුරා
ආදරේ සුරකෙන තුරා
ඔබද මාද දකින තුරා
සොඳුරු ලොවමට ඇරයුමෙන්
නිහඬ වන්නම් මඳ විරාමයකට..

**කාන්ති වික්‍රමසූරිය**

# පහන් වැට

සංස්කරණය
**තුෂාරි ප්‍රියංගිකා**

## කවි....

සඳැස් සහ නිසඳැස් වශයෙන් දෙයාකාර වෙයි. සඳැස් කවි එළි වැට, එළිසමය රකිමින් එකම මාත්‍රා ගණනකින් යුක්තව ලියනු ලබන අතර, නිසඳැස් කවි යනු තමන්ට රිසි සේ නිදහස් ආරකින් තම අදහස් කාව්‍යමය ආකාරයෙන් ඉදිරිපත් කිරීමයි.

## සැමදා මහ මග

මුහුනේ අගට ඇමිනුනු
තුඹේ ජීවිතය
අතුගෑවෙයි
ඉර ඇවිළුණු ගිනි දවාලේ
කෑකෑරෙන උණු තාර පලස දිග
ඒ අත - මේ අත

සිව් රෝද මාලිගා -කවුළුවකින් බලා
හෙලන හිස්මෑ හිස් බෑලුමක් දෙකක් හැර
දූලි තංවා ඉහළ යන දූලි වලා මැද
තනිවුනු මිනිස් ප්‍රාණය
වල ගැහුණු දුබල ඇස් - තාර පොලවමත
ඒ අතට - මේ අතට
තාරගෙන තාරගෙන
ගැඹුරටම ගැඹුරටම
සොයන්නේ දූවිලි - කාසි බරට

දැත් දෙපය ලේ නහර වැල් දිග
ඉල්පී ඇඹරී රටා මැවී ඇත
සාගෙන් පීඩිත කැහැටු කකුල් වල
පතුල් පැලි ගොස් කුහර හැදී ඇත

අඩිය ගෙවී ගිය රබර් සෙරෙප්පුවෙ
මතු වී ඇත දාර තිලක්
ඒ අස්සෙන් එබී එබී
පතුල් හපයි උණු තාර කැටිති
නැතිවා වගේ හිතක් පපුවක්
ඉර ඇවිළුණු ගිනි දවාලේ
තට්ට තනියම
මුහුනේ අගට ඇමිනුනු
ජීවිතය
අතුගෑවෙයි
ඒ අතට - මේ අතට

ප්‍රශංසනී පරණවිතාන

## අවුරුද්ද ඇවිල්ලා

කොහාගෙ ගී හඬ රැව් දී ඇහුනම අවුරුදු එන බව සිහිවන්නේ
තක්කිට තරිකිට රබන් පදේ හඬ අවුරුදු ගතියයි පවසන්නේ
කැවුම් කොකිස් සහ අතිරස සුවඳින් අවුරුදු සිරියයි මුසුවන්නේ
අළුත් ඇඳුම් ඇඳ නැගම් යන විට අවුරුදු ආ බව හෙලිවන්නේ

**-නිර්මලී දිලීපා වික්‍රමනායක**-මෙල්බර්න්

## නියඟය

හිස ගිනි ගෙන දැවෙන තරමට අව් — සැරය
පා හිමි පා වැසුම් නැති පා — අසරණය
සියළු සතුන් හට ඇති මේ — පිපාසය
කවදා තුරන් වේවිද මේ — ඉඩෝරය

දූවිලි තිරය එතෙමින් මග දෙපස — ඇතී
කොළ පැහැ ගස් කොළන් ගුරු පැහැය ගති
ගුරු පාටැති තණ හරකුන් උලා — කතී
ගංගා වැව් හිඳී ගොස් ඉරී තලා — යතී

විස කුරු සතුන් ඇදෙමින් කැලයෙන් ගමට
වතුර සොයයි තොල ගෑමට — පිපාසෙට
ආ බඹරුන් සුවද හමන මල — වෙතට
මල පර නිසා යයි නොදුටු — විලාසෙට

එතෙනා නිළිය ගංගා මහ සයුර — බද
නැටුවා රැල්ල ආදර සෙනෙහසින් — සිඹ
විමසයි සාගරය නොපැමිණෙන ගඟෙන් — අද
නැත්තේ නොඑන්නේ අමනාපයෙන් — වද

අහසට නෙත් යොමා කල දවස — ගෙවෙන්
හේන් කුඹුරු ගොවි තැන් පාළුවට — ගිහින්
තව නම් බලා ඉන්නට බෑ කියමි — හොඳින්
නියඟය මදිද උන්නා දැන් යන්න — ඉතින්

**යසා හේනබර්ග්** - ජර්මනිය

## පුංචි ටිකිරා දිසාපති වූ වගයි

රෝද හතරේ දඬු මොනරේ
නතර කළා වළව්ව ළඟ
බැහැපු ගමන් පිළි ගත්තේ
ලොකු නිලමේ බුලත් අතින්
වාන් දාපු වේල්ල වගේ
කඩුල්ල ළඟ පොඩි මැණිකේ
හිනා වුණා කෝළ හිතින්
ආලවන්ත හිතට මගේ
ටයිපටියක් කරපින්නන්
ජේත්තුවට හිටියට මං
අම්මේ නුඹෙ බාල එකා
එදා වගේමයි තාමත්
වක්කඩ ළඟ දිය කඩිත්තේ
තිත්ත පැටව් අල්ලපු අර
පුංචි එකා නේද බොලන්
ඉටිරූපේ වගේ යසට ඉන්නේ
හීන් එතනා තව එකෙකුගෙ
කණට කරලා මිමිණුවාට
නෑසුණු සේ මම උන්නා
පුංචි ටිකිරා මතක් වෙලා
වෙල් යායේ බඩ වැටියේ
හුළං පොදක සුවය තරම්
සීත කාමරේ හිර වී
ලිපි ගොනු මිටිමේසෙ තියන්
උන්නත් අම්මේ මට නම්
නොවටී පැල් කොටය තරම්

**පුෂ්පිකා ගමගේ**
රොක්ස්බර්ග් පාර්ක්

## වෙසක් බලන්න යමු

වෙසක් බලන්න යද්දී මතකයිද ගියහැටි
රූපියලක් ගෙවා අපාය බලන්නට?
කැන්ගරු දේශේ ඔබට පුංචි ඔත්තුවක් දෙන්නද
මේ වෙසක් පෝයට අපාය නරඹන්න?

ගොසින් කිට්ටුම නගරෙට රෑ දහයෙන් පසුව
ඇවිදගෙන යන්න ඔළුව හැරුණු පැත්තට
පැය බාගයක් තුල නොමිලේම දැකිය හැකි
අපායේ විසිතුරු කිසිම අඩුවක් නැතිව

රංචුගැසී ලෝදිය බොන්නන්
සිහි විකල්ව කටු ඉඹුලේ යන්නන්
මත්ව අත පය කපා ගන්නන්
ඇස ගැසේ අඩියෙන් අඩිය
එපමණින් නොනැවතී - බණ පොතේ අප දුටුව
හැම චරිතයක්මත් - මුණ ගැසෙනු ඇත ඔබට

ගොදුරු සොයමින් යන තන්හා රති රගාලා
සූළු පියවරුන් හට එපාවුණු සෝපාකලා
අතට අසුවන දේ වනසන ආලවකයෝ
ජීවමාන වෙයි - අත්දුටුවයි සත්තයි!

වෛරී මතින් දගලන - නළගනන්ගේ විප්‍රකාර දැක
සසර කළකිරුනොත් හාස් ගා නිවන් යතහැකි
සිදුහත් කුමරු මෙන් හැර නොගොස් ගිහි ගෙය
(මිදිද ගිහි ගෙය තුළම - මේ කරන දුෂ්කර ක්‍රියා?)

අගහිඟ කම් ඇතත් - ලංකාවේ උදවිය
මේ පාරත් යාව් සල්ලි දී අපාය බලන්නට
පින කොහෙද ඔවුන්ට -- අපිට වාගේ
අපායේ සිරි නරඹන්න දවස ගානෙම?

**ශ්‍රියානි පෙරේරා**
සවුත්බෑන්ක්

කියවන්න.. ලියන්න..
තොරතුරු දැනගන්න..
www.ketapathpawra.com
වෙබ් අඩවියට ගොඩ වෙන්න.
ඔබේ අදහස් සහ නිර්මාණ වෙනුවෙන් කැටපත් පවුරෙන් ඉඩක්.

මෙම විශ්වයේ ඇති නොවෙන
එකම දෙය නම්.. මිනිසෙක්,
ගැනීම සඳහා, ඔහුගේම සිතෙ
අරමුණු කර ගන්නා දෙයයි.

"The only permanent thing in
the entire universe is that